සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

33 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

ගිණුම්කරණය - I
# Accounting - I

පැය දෙකයි
Two hours

**උපදෙස්**
- **අංක 01 සිට 30 දක්වා ප්‍රශ්නවල වඩාත් නිවැරදි පිළිතුරෙහි අංකය තෝරා අදාල තිත් ඉර මත පිළිතුරෙහි අංකය ලියන්න.**
- **අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(01) මූල්‍ය වර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශනවල අරමුණ වන්නේ,
1. ව්‍යාපාර ආයතනයක් පිළිබඳව ඇල්මක් දක්වන පර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම
2. ව්‍යාපාර ආයතනයක් පිළිබඳව ඇල්මක් දක්වන පර්ශවයන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයිම
3. ව්‍යාපාර ආයතනයක මූල්‍ය ප්‍රතිඵලය, මූල්‍ය තත්ත්වය හා මුදල් ප්‍රවාහයන් පිළිබඳ තොරතුරු ඇල්මක් දක්වන පර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සැපයීම
4. ව්‍යාපාර ආයතනයේ කළමණාකරුවන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම
5. ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇල්මක් දක්වන පර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සැපයීම (............)

(02) එකතු කළ අගය මත බදු (VAT) අයකිරීම කුමණ ගිණුම්කරණ පරිසර සාධකයකට අනුකූලව සිදුවන්නේද?
1. ආර්ථික හා දේශපාලන පරිසරය
2. සමාජ හා සංස්කෘතික පරිසරය
3. ශිල්පිය හා වෘත්තිය පරිසරය
4. නෛතික පරිසරය
5. තාක්ෂණික පරිසරය (............)

(03) ව්‍යාපාර ආයතනයක අයිතිකරුවන් නමින් ප්‍රාග්ධන ගිණුම්, ගැනිලි ගිණුම්, රඳවාගත් ඉපයුම් ගිණුම්, පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා අදාල වන ගිණුම්කරණ සංකල්පය
1. ව්‍යාපාර ඒකක 2. ආරක්ෂණ 3. අඛණ්ඩ පැවත්ම 4. ප්‍රමාණාත්මකබව 5. සංගතභාවය (............)

(04) මුදල් ශේෂය හැර අනෙකුත් ජංගම වත්කම් හා ජංගම වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අදාළව ද?
1. අඛණ්ඩ පැවත්ම 2. ගැලපුම් 3. මූල්‍ය මිනුම් 4. ප්‍රමාණාත්මකබව 5. උපචිත (............)

(05) මුදල් ලැබීම හා ගෙවීම් ජ'නල් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය වන්නේ,
1. ජ'නලයක් මෙන්ම ප්‍රධාන ලෙජර් ගිණුමකි.
2. මුදලින් ලැබෙන ආදායම් හා මුදලින් ගෙවන වියදම් පළමුව වර්තාකරන ජ'නලයයි.
3. බැංකුව සමඟ කරන මුදල් ගණුදෙනු වාර්තාකරනු ලබන ගිණුමකි.
4. මුදල් ගණුදෙණු සියල්ල පළමුව වර්තාකරන ජ'නල් දෙකක් පමණි.
5. සියලුම මුදල් ගණුදෙණු වර්තාකරණ ලෙජර් ගිණුම් දෙකකි. (............)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 06 හා 07 ට අදාල වේ.**

සුරංගගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසයේ දී සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දක්වේ.

01 - 06 රු 60 000 ක පිරිවැය වූ තොග ණයට මිල දී ගන්නා ලදී.

01 - 10 ණයට මිල දී ගත් තොගවලින් රු 40000 ක පිරිවැය වූ තොග රු 65000 කට ණයට විකුණන ලදී.

01 - 20 අයිතිකරුගේ පෞද්ගලික මුදලින් වෙළෙඳ ණය හිමියන්ට රු 40000 ක් ගෙවන ලදී. ලද වට්ටම රු 2000 කි. (............)

(06) ඉහත ගණුදෙනු මගින් මූලික ගිනුම්කරණ සමීකරණයට ඇතිවන ශුද්ධ බලපෑම

| | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| 1. | 85 000 | 25 000 | 60 000 |
| 2. | 85 000 | 67 000 | 18 000 |
| 3. | 125 000 | 65 000 | 60 000 |
| 4. | 85 000 | 65 000 | 20 000 |
| 5. | 45 000 | 25 000 | 20 000 |

(............)

(07) ඉහත සඳහන් ගණුදෙණු වර්තා කිරීමට අදාල වන ජ'නල් (උපයෝගි පොත්) පිළිවෙලින් ,

1. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය
2. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය
3. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් ගෙවීම ජ'නලය
4. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, බැංකු ගිණුම් ප්‍රකාශනය
5. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පාලන ගිණුම (............)

(08) ගණුදෙනු හා සිද්ධින් වාර්තා කිරීම සඳහා භාවිතා කරන උපයෝගි පොත් (ජ'නල්) හා පොදු ලෙජරය පිළිබඳව ප්‍රකාශන කිහිපයක් පහත දක්වේ.

A ගණුදෙනු හා සිද්ධින්වල වටිනාකම පළමුව ජ'නල්වල වර්තා කරයි.

B මුදල් පාලන ගිණුම තුළ මුදලින් ලද ආදායම් හා මුදලින් ගෙවන ලද වියදම් පමණක් සටහන් කරයි.

C පොදු ලෙජරය පදනම්කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

D ආයතනයේ සියලුම ණයට ගැනුම් හා විකුණුම් ගැනුම් හා විකුණුම් ජ'නලය තුළ වාර්තා කරයි.

E ණයගැති ලෙජරය තුළ වෙළෙඳ ණයගැතියන්ගේ පෞද්ගලික ගිණුම් පමණක් තබා ගනී.

ඉහත ප්‍රකාශනවලින් නිවරදි ප්‍රකාශ / ප්‍රකාශන වන්නේ,

1. A C D E 2. A C D 3. A C E 4. BD 5. A B C D E (............)

(09) ව්‍යාපාරයක 2018-03-31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුම අසමාන විය. පසුව පහත වැරදි අනාවරණය වී ඇත.

1. රු 3200 ක විදුලි ගාස්තු, මුදල් ගෙවීම් ජ'නලය තුළ වාර්තාකර තිබූ අතර විදුලි ගාස්තු ගිණුමට රු 2300ක් ලෙස හර කර ඇත.
2. පොදු ජ'නලය තුළ වර්තාකර තිබූ රු 300 ක බොල් ණය කපා හැරීම ණයගැති පාලන ගිණුමට හර කර තිබිණි.
3. 200 ක ආපසු එවුම් පිළිබඳව කිසිම සටහනක් ජ'නල්වල හා ලෙජරයේ වර්තාකර නැත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ලෙජරයේ පැවති අවිනිශ්චිත ගිණුමේ ශේෂය

1. රු 500 හර 2. රු 800 හර 3. 300 හර 4. රු 500 බැර 5. 300 බැර (............)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 10 හා 11 ට අදාල වේ.**

ව්‍යාපාරයක 2018-03-31 දිනට ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව ණයගැති පාලන ගිණුමේ ශේෂය සමඟ සමාන නොවිය. එදිනට ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව රු 420 000 කි. පසුව සොයාගත් වැරදි හා මගහැරීම්

1. රුවන්ට ණයට විකුණුම් රු 270 000ක් විකුණුම් ජ්නලයේ හා පොදු ලෙජරයේ වාර්තා කර තිබූ අතර ණයගැති ලෙජරයේ රුවන්ගේ ගිණුමට රු 200 000 ලෙස පිටපත් කර ඇත.
2. ණයගැති ලෙජරයේ උපුල්ගේ ගිණුමේ පැවති රු 50 000 ශේෂය, ශේෂ ලැයිස්තුවට උපුටා ගෙන නැත.
3. විකුණුම් ජ්නලයේ එක් පිටුවක එකතුව රු 10 000 ක් වැඩියෙන් එකතු වී තිබිණි.
4. ණයගැතියකු වන ප්‍රදීප්ට දුන් රු 20 000 ක වට්ටම පොදු ලෙජරයේ සටහන් කර තිබූ අතර ප්‍රදීප්ගේ ගිණුමට පිටපත් කර නැත.

(10) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති පාලන ගිනුමේ පැවති ශේෂය

1. 550 000 2. 450 000 3. 570 000 4. 530 000 5. 520 000 (............)

(11) 2018-03-31 දිනට ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ නිවැරදි අගය

1. 410 000 2. 560 000 3. 540 000 4. 510 000 5. 520 000 (............)

(12) ව්‍යාපාරයක 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ තොරතුරු

* වාර්ෂික විදුලි බිල්පත්‍රවල එකතුව (වාර්ෂික විදුලිය වියදම)රු 1500
* 2017-04-01 දිනට උපචිත විදුලි ගාස්තු රු 200
* 2018-03-31 දිනට උපචිත විදුලි ගාස්තු රු 300
* 2018-01-01 දින ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දුන් අතර ඒ සඳහා ලැබුණු වාර්ෂික බදු කුලිය රු. 1200

2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,

| | මුදලින් ගෙවන ලද විදුලි ගාස්තු | ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා බදු කුලී ආදායම |
|---|---|---|
| 1. | 1600 | 300 |
| 2. | 1400 | 1200 |
| 3. | 1400 | 300 |
| 4. | 1500 | 300 |
| 5. | 1500 | 1200 |

(............)

The National e-Learning Portal for The General Education

(13) මූල්‍ය ගිණුම්කරණය හා සම්බන්ධ වන ගණිතමය සම්බන්ධතාවයන් (සමීකරණ) කිහිපයක් පහත දක්වේ. නිවැරදි සමීකරණය හෝ සමීකරණ වන්නේ,

A. ශුද්ධ වත්කම් = මුළු වත්කම් - බාහිර වගකීම්
B. ශුද්ධ ලාභය හෝ ආලාභය = වසර අග හිමිකම් - වසර මුල හිමිකම් + ගැනිලි - අමතර ප්‍රාග්ධනය
C. ක්ෂය කළ හැකි අගය = පිරිවැය හෝ ආදේශ කළ අගය - සමුච්චිත ක්ෂය
D. දේපල පිරියත හා උපකරණ
විකිණීමේ ලාභය හෝ අලාභය = විකුණුම් මිල - ධාරණ අගය

1. AB 2. ABCD 3. AD 4. ABC 5. ABD (............)

(14) ව්‍යාපාර ආයතනයක පොත්වලින් වෙළෙඳ ණයගැතියන් සම්බන්ධයෙන් උපුටාගත් තොරතුරු

| | රු(000) |
|---|---|
| 2018-03-31 දිනට ණයගැති පාලන ගිණුම | 1800 |
| 2017-04-01 දිනට හානිකරන අලාභ ඉඩ හැරිම (අඩමාණ ණය වෙන් කිරීම) | 150 |
| 2018-03-31 දිනට බොල් ණය ගිණුම | 30 |

වෙනත් තොරතුරු

- වර්ෂය තුළ දී කපාහරින ලද බොල් ණයවලින් රු 10,000 ක් ලැබුණ අතර එය මුදල් ලැබිම් ජ්නලයෙන් විකුණුම් ගිණුමට බැර කර තිබිණි.
- 2018-03-31 දිනට හානිකරණ අලාභ සඳහා ඉඩ හැරිම (අඩමාණ ණය වෙන් කිරීම) ණයගැතියන්ගෙන් 10% ලෙස තබාගත යුතුය.

2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගත යුතු බොල් ණය හා හානිකරණ අලාභ ඉඩ හැරීම

1. 70 2. 60 3. 50 4. 170 5. 130 (............)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 15 හා 16 අදාල වේ.**

ව්‍යාපාරයක මුදල් ගණුදෙණු සියල්ල ජංගම ගිණුමක් මඟින් කරනු ලැබේ. මුදල් ගණුදෙනු පිළිබඳ තොරතුරු

| | 2019-01-31 දිනට (000) | 2019-02-28දිනට (000) |
|---|---|---|
| උපලබ්ධි නොවූ චෙක් | - | 160 |
| ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | 100 | 150 |
| බැංකු ගිණුම් ප්‍රකාශනය අනුව ශේෂය | 700 | 680 |

අනෙකුත් තොරතුරු (000)

| | | |
|---|---|---|
| * | පෙබරවාරි මස උපලබ්ධි වූ චෙක්පත් | 1800 |
| | පෙබරවාරි මස බැංකුව ගෙවීම් කළ චෙක්පත් | 1480 |
| | ඍජු ප්‍රේෂණ අමල් | 200 |
| | ස්ථාවර නියෝග ගෙවීම් - රක්ෂණ වාරිකය | 40 |

* ජනවාරි මස 31 දිනට උළුලබ්ධි නොවූ චෙක්පත් හා ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක් පෙබරවාරි මාසය තුලදී බැංකුවට ඉදිරිපත් කර නිෂ්කාෂණය වී ඇත.

(15) මුදල් පාලන ගිණුමට අනුව නිවැරදි (සංශෝධිත) ශේෂයන්

| | 2019-01-31 දිනට (000) | 2019-02-28 දිනට (000) |
|---|---|---|
| 1. | 700 | 680 |
| 2. | 600 | 690 |
| 3. | 800 | 690 |
| 4. | 600 | 840 |
| 5. | 600 | 670 |

(............)

(16) පෙබරවාරි මාසය සඳහා මුළු මුදල් ලැබීම් හා ගෙවීම්

| | මුදල් ලැබීම් (000) | මුදල් ගෙවීම් (000) |
|---|---|---|
| 1. | 1800 | 1480 |
| 2. | 2000 | 1520 |
| 3. | 2160 | 1570 |
| 4. | 2160 | 1520 |
| 5. | 2160 | 1530 |

(............)

(17) එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී නැති ආයතනයක 2019-01-01 දින මිල දී ගත් යන්ත්‍රයකට අදාල වියදම්

| | | |
|---|---|---|
| * | 15%ක VAT බදු සහිත ගැනුම් මිල | 345 000 |
| * | වාර්ෂික රක්ෂණ ගාස්තුව | 12 000 |
| * | ප්‍රවාහන හා සවිකිරීමේ වියදම් | 15 000 |
| * | යන්ත්‍රය අත්හදා බැලීම සඳහා දරන ලද නිෂ්පාදන පිරිවැය | 10 000 |
| * | අත්හදා බැලීම සඳහා නිපදවූ බිස්කට්වල විකුණුම් මිල | 6 000 |

LKAS 16 දේපල පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුව හඳුනාගත යුතු යන්ත්‍රයේ පිරිවැය

1. 325 000 2. 382 000 3. 319 000 4. 364 000 5. 331 000 (............)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 18 හා 19ට අදාළ වේ.**

* අමල් හා බිමල් 2 : 1 අනුපාතයට ලාභලාභ බෙදා ගන්නා හවුල්කරුවෝ වෙති.
2017-04-01 දිනට ප්‍රාග්ධන ගිණුම්
අමල් රු 700 000 බිමල් රු 500 000

* 2019-04-01 දින චමල් ව්‍යාපාරයට බඳවාගත් අතර ඔහු රැගෙන ආ ප්‍රාග්ධනය රු 300 000 කි.

* චමල් බඳවා ගන්නා දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු 600 000 ක තක්සේරු කරන ලදී. කීර්තිනම ගිණුමක් තබා නොගන්නා අතර සියලු ගැලපීම් ප්‍රාග්ධන ගිණුම මඟින් කරන ලදී.

* අමල් බිමල් චමල් ලාභ අලාභ පිළිවෙලින් 3 : 2 : 1 අනුපාතයට බෙදා ගනු ලැබේ.

* මූල්‍ය ප්‍රකාශනවලින් ලබාගත් තොරතුරු

| | 2017-03-31 දිනට (000) | 2018-03-31 දිනට (000) |
|---|---|---|
| අමල් | 280 | 820 |
| බිමල් | 240 | 600 |
| චමල් | - | 200 |

* අමල් රු 60 000 ක් සහ බිමල් රු 40 000 ක් ගැනිලි වශයෙන් ලබා ගෙන ඇත.

(18) 2017-04-01 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම

1. 1200, 000 2. 2020 000 3. 1800 000 4. 1500 000 5. 2320 000

(............)

(19) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| | ලාභය | චමල්ගේ හිමිකම |
|---|---|---|
| 1. | 1 200 000 | 400 000 |
| 2. | 1 200 000 | 200 000 |
| 3. | 1 200 000 | 500 000 |
| 4. | 1 300 000 | 500 000 |
| 5. | 1 300 000 | 400 000 |

(............)

(20) LKAS 16 ප්‍රමිතය අනුව දේපල පිරියත උපකරණ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශන වන්නේ,

A අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ව්‍යාපාරයට හිමිවන ජංගම නොවන වත්කම්ය

B නිෂ්පාදන කටයුතු, පරිපාලන කටයුතු, බෙදා හැරීමේ කටයුතු හෝ අන් අයට කුලියට දීම සඳහා ඇති ස්පෘශ්‍ය වත්කම්ය

C වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂිත ස්පෘශ්‍ය වත්කම්ය

D නිෂ්පාදන කටයුතු, පරිපාලන කටයුතු, බෙදා හැරීමේ කටයුතු සඳහා භාවිතා කරන ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය වත්කම්ය

1. A B C 2. A D 3. B C D 4. B C 5. A B (............)

(21) රංගනගේ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතුරු

| | 2018-03-31 දිනට (රු 000) | 2017-03-31 දිනට (රු 000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 700 | 500 |
| රඳවාගත් ඉපයුම් ගිණුම | 240 | 150 |

වෙනත් තොරතුරු

1. අතිරේක ප්‍රාග්ධන යෙදවීම් රු 200 000 කි.
2. වර්ෂය තුළ දී ලබාගත් මුදල් ගැනිලි රු 60 000 කි.

| | 2018-03-31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය (000) | 2018-03-31 දිනට ශුද්ධවත්කම් (000) |
|---|---|---|
| 1. | 150 | 880 |
| 2. | 150 | 940 |
| 3. | 150 | 1140 |
| 4. | 240 | 940 |
| 5. | 180 | 880 |

(............)

(22) සීමාසහිත පොදු සමාගමක පොදු පරමාර්ථ සඳහා සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල සංරචක පිළිබඳ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ. එවායින් නිවරදි ප්‍රකාශය / ප්‍රකාශන වන්නේ,

A ආදායම් ප්‍රකාශනය උපචිත පදනමට සකස් කරනු ලැබේ.

B මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මගින් මූල්‍ය තත්වය වෙනස් වීම පෙන්නුම් කරනු ලැබේ.

C මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මගින් යම් කාල පරිච්ඡේදයක වත්කම් වගකීම් හා හිමිකම්වල වටිනාකම් ඉදිරිපත් කරනු ලැබේ.

D හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය මගින් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුමේ වෙනස්වීම් පෙන්නුම් කරනු ලැබේ.

1. A B D 2. A B C 3. A B 4. A පමණි 5. A B C D සියල්ලම

(............)

■ **පහත තොරතුරු ප්‍රශ්න අංක 23 හා 24 ට අදාල වේ.**

සීමිත අමයා පොදු සමාගමේ 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතුරු

| | (රු 000) |
|---|---|
| විකුණුම් ආදායම | 900 |
| විකුණුම් පිරිවැය | 400 |
| මෝටර් රථ විකුණුම් ලාභ | 20 |
| බෙදා හැරීමේ හා පරිපාලන වියදම් | 300 |
| වාර්ෂික ආදායම් බදු | 70 |

වෙනත් තොරතුරු

* 2018-03-31 දිනට දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇති අතර එමගින් ඇතිවූ ලාභ / අලාභ
- ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය රු 80 000
- කාර්යාලීය උපකරණ ප්‍රත්‍යාගණන අලාභය රු 15 000

* 2017-03-31 දින ඉඩම ප්‍රථම වතාවට ප්‍රත්‍යා ගණනය තුළින් රු 30 000 ක අතිරික්තයක් ද කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය තුළින් රු 25 000 ක අතිරික්තයක් ද වාර්තා කර තිබිණි.

(23) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| | මුළු ආදායම (000) | වෙනත් විස්තීරණ ආදායම් (000) |
|---|---|---|
| 1. | 1000 | 80 |
| 2. | 920 | 80 |
| 3. | 920 | 65 |
| 4. | 1000 | 65 |
| 5. | 900 | 65 |

(............)

(24) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ,

| | වර්ෂයේ ලාභය (රු. 000) | මුළු විස්තීරණ ආදායම (රු. 000) |
|---|---|---|
| 1. | 150 | 65 |
| 2. | 220 | 80 |
| 3. | 135 | 80 |
| 4. | 135 | 215 |
| 5. | 150 | 215 |

(............)

(25) සීමාසහිත මිලාරි පොදු සමාගමේ 2018 ජනවාරි මස සිදු වූ ගණුදෙණු කිහිපයක් මෙසේය.

* 2018-01-01 දින රු 20 බැගින් වූ සාමාන්‍ය කොටස් 10 000 ක් නිකුත් කර මුදල් ලබා ගෙන ඇත.

* 2018-01-10 දින රු 60 000 ක ලාභාංශ මුදලින් ගෙවන ලදී.

* 2018-01-31 දින රඳවාගත් ඉපැයුම් භාවිතා කරමින් රු 20 බැගින් වූ සාමාන්‍ය කොටස් 5 000 ක් ප්‍රාග්ධනිත කරන ලදී.

* ඉඩම ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය තුළින් රු 90 000 ක අතිරික්තයක් වාර්තා කර ඇත.

ඉහත ගණුදෙනු මඟින් 2018-01-31 දිනට

| | ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම (000) | මුළු හිමිකම වැඩිවීම (000) |
|---|---|---|
| 1. | 200 | 290 |
| 2. | 200 | 230 |
| 3. | 300 | 230 |
| 4. | 300 | 290 |
| 5. | 300 | 330 |

(............)

(26) බදු නිදහස් සමාගමක් වන සීමාසහිත අරලිය පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | 2017-03-31 දිනට (රු 000) | 2018-03-31 (රු 000) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම | 3000 | 3400 |
| රඳවාගත් ඉපයුම් ගිණුම | 1300 | 1800 |

වෙනත් තොරතුරු :-

* වාර්ෂික ක්ෂය වීම් රු 130 000
* ගෙවූ ලාභාංශ රු 300 000
* සාමාන්‍ය කොටස් නිකුත් කිරීම රු 400 000

2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ,

| | කාරක ප්‍රාග්ධන අයිතම ගැලපීමට පෙර මෙහෙයුම් මුදල් ප්‍රවාහය (රු. 000) | මූල්‍ය කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහය (රු. 000) |
|---|---|---|
| 1. | 500 | 100 |
| 2. | 800 | 100 |
| 3. | 630 | 300 |
| 4. | 930 | 100 |
| 5. | 630 | (300) |

(............)

(27) සීමිත අරුණ පොදු සමාගමේ 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018-05-20 දින අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලදී. 2018-05-30 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කරන ලදී.

2018-03-31 දින සිට 2018-05-31 දක්වා කාලය තුළ දී සිදු වූ ගණුදෙණු

A 2018-03-31 දින පැවති ඉතිරි තොගය 630 000 කි. 2018-04-30 දින මෙම තොගය රු 600 000 විකුණන ලදී.

B 2018-04-02 දින අරුණ සමාගම සීමිත ප්‍රදීපා සමාගමේ රු 50 බැගින් වූ සාමාන්‍ය කොටස් 1000 ක් මිල දී ගන්නා ලදී. 2018 -05-20 දිනට එක් කොටසක වෙළෙඳ පොළ අගය රු 60 කි.

C 2018-03-25 දින රු 60000 කට ණයට විකුණන ලද තොගයක් 2018-04-02 දින ආපසු එවන ලදී. මෙම තොගය 2018-03-31 දිනට කල් ඉකුත් වී තිබූ තොගයකි.

D 2018-05-12 දින සමාගමේ රු 10000 ක ධාරන අගයක් සහිත ඉඩමක් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගන්නා ලදී, 2018-05-30 දිනට රු 120 000 ක වන්දි මුදලක් ලැබිණි.

LKAS 10 වර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසු සිදුවීම් ප්‍රමිතියට අනුව ගලපන සිදුවීම් වන්නේ,

1. A B C 2. A C 3. C D 4. B D 5. A පමණි

(............)

(28) සීමිත කපිල පොදු සමාගම 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී දින 360 ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබිණි. මූල්‍ය ප්‍රකාශනවලින් ලබාගත් තොරතුරු,

| | |
|---|---|
| අත්පිට විකුණුම් | රු 30 000 |
| ණයට විකුණුම් | රු 63 000 |
| ආපසු එවුම් | රු 3 000 |
| සාමාන්‍ය ණයගැතියෝ | රු 2 000 |

ණය එකතු කිරීමේ සාමාන්‍ය කාලය

1. දින 6   2. දින 7   3. දින 24   4. දින 16   5. දින 12 (............)

(29) ජංගම අනුපාතය හා ණය හිමිකම් අනුපාතය (තෝලන) වැඩි වීම බලපාන ගණුදෙණුවක් වන්නේ,

1. රු 6 000 ක තොග අත්පිට මුදලට මිල දී ගැනීම
2. රු 3000 ක තොග රු 3500 කට අත්පිට විකිණීම
3. රු 1 500 විදුලි බිල් ගෙවීම
4. රු 10 000 ක ණය මුදලක් ලබා ගැනීම
5. කොටස් නිකුත් කර රු 5000 ක මුදලක් ලබා ගැනීම (............)

(30) සීමා සහිත පොදු සමාගමක යම් නිශ්චිත කාල පරිච්ඡේදත් වෙනුවෙන් සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සංරචක වන්නේ,

A ආදායම් ප්‍රකාශනය   B මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය   C බැංකු සැසඳුම් ප්‍රකාශනය
D මුදල් ප්‍රවාහ ප්‍රකාශනය   E හිමිකම් වෙනස වීමේ ප්‍රකාශනය

1. AB   2. ADE   3. ABCD   4. ACDE   5. ABCDE (............)

■ **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(31) පහත සඳහන් ගණුදෙණු හා සිද්ධීන් වාර්තා කිරීමට අදාළ **ලෙජර් ගිණුම්** වර්ග නම් කරන්න.

| ගණුදෙනුව | ලෙජර් ගිණුම් 1 | ලෙජර් ගිණුම් 2 |
|---|---|---|
| 1. බොල් ණය කපා හැරීම | .................................................... | .................................................... |
| 2. උපචිත විදුලි ගාස්තු | .................................................... | .................................................... |
| 3. ආපසු එවුම් | .................................................... | .................................................... |
| 4. තොග අගය කපා හැරීම | .................................................... | .................................................... |

(32) මූල්‍ය ප්‍රකාශන තුළ දක්නට ලැබෙන අයිතම කිහිපයක් පහත දක්වේ. එක් එක් අයිතමයට සම්බන්ධ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| අයිතමය | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| 1. විකුණුම් ආදායමෙන් විකුණුම් පිරිවැය අඩු කිරීම | ............................................................ |
| 2. ඉදිරියට ගෙවූ වියදම් වත්කම් ලෙස සටහන් කිරීම | ............................................................ |
| 3. ඵලදායි ජීව කාලය වර්ෂයකට වඩා වැඩි වත්කම් මිලදී ගැනීම් ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනා ගැනීම | ............................................................ |
| 4. සාපේක්ෂව වැඩි වටිනාකම් සහිත, වර්ෂයකට වඩා වැඩි කල්බදු ගිවිසුම් වත්කම් ලෙස හඳුනා ගැනීම | ............................................................ |

(33) මූල්‍ය වර්තාකරණයේ සංකල්පනාත්මක අනුව මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කරන තොරතුරුවල,

i. මූලික ගති ලක්ෂණ 2 නම් කරන්න.

1) ....................................................................   2) ....................................................................

ii. වැඩි දියුණුකිරීමේ ගති ලක්ෂණ 2 ක් නම් කරන්න.

1) ....................................................................   2) ....................................................................

(34) නිෂ්පාදන ව්‍යාපාරයක පිරිවැය ලේඛනයෙන් උපුටා ගන්නා ලද තොරතුරු,

* මුළු නිෂ්පාදන පිරිවැය රු. 124 000
* ප්‍රථමික පිරිවැය රු. 72 000

නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී පහත වැරදි හා මඟහැරීම් සිදු වී ඇත.

1. රු 4000 ක අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී, බෙදා හැරීමේ වියදම් ගිනුමට හර කර තිබිණි.
2. නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන යන්ත්‍රවල ක්ෂය වීම් 6000 පරිපාලන වියදම් ලෙස සටහන් කර තිබිණි.
3. අවසාන නොනිමි තොගය රු 2000 ක් වූ අතර එය නිෂ්පාදන පිරිවැය ලේඛනයට ගැලපීම් කර නැත.

අවශ්‍ය වන්නේ,

1. නිවැරදි ප්‍රාථමික පිරිවැය

.......................................................................................................................

2. නිවැරදි නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

.......................................................................................................................

3. මුළු නිෂ්පාදන පිරිවැය

.......................................................................................................................

(35) * උදය නාලක හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ 3:2 අනුපාතයට බෙදා ගනු ලැබේ.

* 2017-04-01 දින තාරක බඳවා ගත් අතර මුදලින් යෙදු වූ ප්‍රාග්ධනය රු 1 400 000 කි.
* උදය නාලක තාරක ලාභලාභ 3 : 2 : 1 අනුපාතයට බෙදා හැරීමට එකඟ වී ඇත.
* තාරක බඳවා ගන්නා දින තක්සේරු කරනලද කීර්තිනාමය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපීම් කරන ලදී.
* 2018-03-31 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ

උදය රු 1960,000 නාලක රු 1840,000 තාරක රු 1300,000

i. තාරක බඳවා ගත් දින හවුල් ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය

.......................................................................................................................

ii. 2017-03-31 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්

උදය ....................................................... නාලක .......................................................

(36) පහත සඳහන් ගණුදෙණු LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රමිතියට අනුව මෙහෙයුම්, ආයෝජන, මූල්‍ය වශයෙන් වර්ග කර දක්වන්න.

1. වෙළෙඳ ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම් .....................................................................
2. දිගු කාලීන බැංකු ණය ලබා ගැනීම .....................................................................
3. පැරණි මෝටර් රථයක් අත්පිට විකිණීම .....................................................................
4. බැංකුව විසින් අය කළ ගාස්තු .....................................................................

(37) ව්‍යාපාර ආයතනයක සුළු මුදල් අග්‍රිමය රු. 10000 කි. 2019-01-31 දින ප්‍රතිපූර්ණය කළ අග්‍රිමය රු 8900 කි.

i. ජනවාරි මස සුළු වියදම් වාර්තා කිරීමේ ජ'නල් සටහන

.......................................................................................................................

.......................................................................................................................

ii. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමේ ජ'නල් සටහන

.......................................................................................................................

.......................................................................................................................

(38) භාණ්ඩ බෙදා හරින ව්‍යාපාරයක 2019 ජනවාරි මාසයේ සේවක වැටුප් පිළිබඳ වැටුප් ලේඛනයෙන් උපුටාගත් තොරතුරු,

* මූලික වැටුප් වල එකතුව රු 40 000
* දළ වැටුප්වල එකතුව රු 50 000
* සේවක සුබ සාධක සමිතියට අඩු කිරීමේ රු 4 000
* අර්ථ සාධක අරමුදලට මූලික වැටුපෙන් 10% ක් අඩුකර ගන්නා අතර සේව්‍ය දායකය 15% කි.
* සෑම මසකම වැටුප් හා අනෙකුත් අඩු කිරීම ඊළඟ මස 05 වන දින ගෙවනු ලැබේ.

i. ජනවාරි මාසය සඳහා සේවකයන් සම්බන්ධ මුළු වියදම

..........................................................................................................................................................

ii. ජනවාරි 31 දිනට මුළු වගකීම්

..........................................................................................................................................................

(39) භාණ්ඩ බෙදාහරින ව්‍යාපාරයක A B C යනුවෙන් තොග අයිතම තුනක් අලෙවි කරනු ලැබේ. 2018-03-31 දිනට ඉතිරි තොගවල වටිනාකම

| | පිරිවැය රු 000 | ශුද්ධ උපලබ්ධි අගය රු 000 |
|---|---|---|
| A | 750 | 720 |
| B | 680 | 700 |
| C | 460 | 450 |

i. LKAS 02 තොග ප්‍රමිතියට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා තොග වටිනාකම

..........................................................................................................................................................

ii. ඉතිරි තොගය වර්තා කිරීමේ ජ'නල් සටහන

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(40) හවුල් ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් ප්‍රකාශන කිහිපයක් පහත දක්වේ. එම ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

i. හවුල් කරුවන් ලාභ අලාභ සෑම විටම සම සමව බෙදා ගත යුතුය ............................................
ii. හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් නමින් ජංගම ගිණුම් තබා ගැනීම අනිවාර්ය වේ. ............................................
iii. හවුල් ව්‍යාපාරවල ආදායම් ප්‍රකාශනය උපචිත පදනමට සකස් කළ යුතුය. ............................................
iv. හවුල් ව්‍යාපාරවල අයිතිය වෙනස් වන සෑම අවස්ථාවකම කීර්තිනාමය ගැළපීම් කළ යුතුය. ............................................

(41) සීමිත සාරංග පොදු සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියා පදිංචි ආයතනයකි. 2019 ජනවාරි මාසයේ දී ණයට ගැනුම් හා විකුණුම් සම්බන්ධ ගණුදෙණු (ගැණුම් හා විකුණුම් සඳහා VAT අනුපාතය 15% කි)

* 01 - 12 ණයට ගැනුම් VAT සහිතව රු 460000
* 01 - 20 ණයට විකුණුම් VAT සහිතව රු 575000
* 01 - 25 ආපසු එවුම් VAT සහිතව රු 23000

i. ආදායම් ප්‍රකාශන තුළ හඳුනා ගන්නා

- ශුද්ධ විකුණුම් ආදායම ..........................................................................................
- ගැනුම් වියදම් ..........................................................................................

ii. ජනවාරි 31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය

..........................................................................................................................................................

(42) ටී ෂර්ට් නිෂ්පාදනය කරන ආයතනය පිරිවැය අයිතම කිහිපයක් පහත දක්වේ. එම අයිතම සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන නොවන පොදු කාර්ය යන්න සඳහන් කරන්න.

1. ටී ෂර්ට් සඳහා රෙදි ..........................................................................................

2. ටී ෂර්ට් මසන සේවක වැටුප් ..........................................................................................

3. කාර්යාලීය ලිපිද්‍රව්‍ය ..........................................................................................

4. යන්ත්‍ර ක්ෂය ..........................................................................................

(43) පහත සඳහන් ගිණුම්කරණ අනුපාත අයිතිකරුවන්, කළමණාකරුවන්, ආයෝජකයින්, ණය සැපයුම්කරුවන්, රජය, ගණුදෙනුකරුවන් යන කුමන පාර්ශවයකට වැදගත් වන්නේ ද?

ගිණුම්කරණ අනුපාතය වැදගත් වන පර්ශවය

1. කොටසක ඉපයුම් අනුපාතය ..........................................................................................

2. පොලී ආවරණ අනුපාතය ..........................................................................................

3. ජංගම අනුපාතය ..........................................................................................

4. ණය හිමිකම් අනුපාතය ..........................................................................................

(44) භාණ්ඩ බෙදා හරින ව්‍යාපාරයක 2018-03-20 දින ගබඩාවේ ගින්නක් හටගෙන තොගවලින් කොටසක් විනාශ විය. මාර්තු මස පොත්වලින් උපුටාගත් තොරතුරු

| | | | |
|---|---|---|---|
| * | විකුණුම් | රු | 125 000 |
| | ගැනුම් | රු | 96 000 |
| * | මාර්තු 01 දිනට තොගය | රු | 12 000 |
| * | මාර්තු 31 දිනට තොගය | රු | 2 000 |

විකුණුම් මත දළ ලාභ අනුපාතය 20% කි.

මාර්තු 20 දින විනාශ වූ තොගයේ පිරිවැය ගණනය කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(45) සීමිත මයුර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලින් උපුටාගත් තොරතුරු

| | රු. 000 |
|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 5000 |
| රඳවාගත් ඉපයුම් ගිණුම | 2000 |
| ජංගම වත්කම් | 6000 |

වෙනත් තොරතුරු

| | |
|---|---|
| ජංගම අනුපාතය | 3 : 1 |
| ණය අනුපාතය | 30% |

පහත දෑ ගණනය කරන්න.

i. සමාගමේ මුළු ප්‍රාග්ධනය ..........................................................................................

ii. ණය ප්‍රාග්ධනය (දිගු කාලින ණය) ..........................................................................................

iii. මුළු වත්කම් ..........................................................................................

The National e-learning Portal - The General Education

(46) ව්‍යාපාරයක 2019-01-31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය (බැංකු ගිණුමේ ශේෂය) රු 325 000 ක් වූ අතර බැංකු ගිණුම් ප්‍රකාශනයේ බැර ශේෂය රු 300 000 ක් විය. මෙම තත්වය ඇති වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (මුදල් පාලන ගිණුමේ හා බැංකු ගිණුම් ප්‍රකාශනයේ වැරදි සිදු වී නැත.)

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

(47) LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම සහ වැරදි) ප්‍රමිතියට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා දෙක සඳහන් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

- පහත තොරතුරු අංක 48, 49 ප්‍රශ්නවලට අදාළ වේ.

ක්‍රීඩා සමාජයක පොත්වලින් උපුටාගත් තොරතුරු

| | 2018-03-31 (රු 000) | 2017-03-31 (රු 000) |
|---|---|---|
| සමුච්චිත අරමුදල | 940 | 890 |
| දේපල පිරියත හා උපකරණ ධාරණ අගය | 650 | 700 |
| හිඟ සාමාජික මුදල් | 20 | 10 |
| බැංකු ශේෂය | ? | 180 |

වෙනත් තොරතුරු

i. 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සාමාජික මුදල් ආදායම රු 460 000 කි.

ii. 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇතුළත් වීමේ ගාස්තු ලැබීම් රු 30 000

iii. ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලැබුණු පරිත්‍යාග රු 200 000 කි.

(48) 2018-03-31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා

1. මුළු ආදායම ..............................................................................................

2. මුළු වියදම ..............................................................................................

(49) 2018-03-31 දිනට බැංකු ශේෂය ගණනය කරන්න. (එක් එක් මුදල් ලැබීම් හා ගෙවීම් වෙන් වෙන්ව දක්වමින්)

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(50) ව්‍යාපාර ආයතනයක් 2019-01-01 දින රු 6 000 000 ක ධාරන අගයක් සහිත මෝටර් රථයක් රු 9 000 000 ක් ධාරන අගයත් සහිත මෝටර් රථයක් සමඟ හුවමාරු කරන ලදී. ගණුදෙනුව පියවීම සඳහා රු 3 600 000 ක මුදල ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

මෝටර් රථ හුවමාරුවේ ඇති වූ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

33 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

ගිණුම්කරණය - II
Accounting - II

පැය 3 මි. 10
3 Hrs. & 10 Min

**උපදෙස්**

- **පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.**
- **අදාල පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න.**

(01) සීමිත සනාරි පොදු සමාගම විදුලි උපකරණ අලෙවි කිරීමේ නිරතව සිටින එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි.

2018-03-31 දිනට ශේෂ පිරික්සුම (රු 000)

| | හර | බැර |
|---|---|---|
| විකුණුම් | | 25600 |
| ගැනුම් | 16200 | |
| 2017-04-01 තොගය | 1320 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1860 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 1750 |
| VAT බදු පාලන ගිණුම | 60 | |
| බැංකු ශේෂය | 2085 | |
| දේපල පිරියත උපකරණ පිරිවැය | 13600 | |
| 2017-04-01 දිනට සමුච්ත ක්ෂය | | 2570 |
| සේවක වැටුප් ශුද්ධ | 2700 | |
| ප්‍රදර්ශනාගාර බදු කුලී | 750 | |
| විදුලි ගාස්තු | 660 | |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 6400 |
| 2017-04-01 දිනට රඳවාගත් ඉපයුම් | | 1840 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | | 1000 |
| 2017-04-01 දිනට ආදායම් බදු වෙන් කිරීම | | 230 |
| 2017-04-01 දිනට වගකීම් සහතික ප්‍රතිපාදන | | 100 |
| විදුලි උපකරණ අලුත් වැඩියා හා සේවා කිරීම් (වගකීම් සහතික සඳහා) | 260 | |
| සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම් | 425 | |
| ගෙවූ ලාභාංශ | 640 | |
| ගෙවූ ආදායම් බදු | 690 | |
| බැංකු ණය | | 2000 |
| ණය පොලී | 240 | |
| | 41490 | 41490 |

වෙනත් තොරතුරු

i. 2018-03-31 දිනට ඉතිරි තොගය පිරිවැයට රු 1240 000 කි. එහි ඇස්තමේන්තුගත විකුණුම් මිල රු 1310 000 ක් වූ අතර ඇස්තමේන්තුගත විකුණුම් වියදම රු 100 000 කි.

ii. දේපල පිරියත හා උපකරණවල සංයුතිය (රු 000)

| වත්කම | පිරිවැය/ප්‍රත්‍යාගණන අගය 2018-03-31 දිනට | සමුච්චිත ක්ෂය 20127-04-01 දිනට | වාර්ෂික ක්ෂය අනුපාතය |
|---|---|---|---|
| ඉඩම ධාරන අගය | 4200 | - | |
| ගොඩනැගිලි පිරිවැයට | 3000 | 1030 | 5% |
| මෝටර් රථ පිරිවැයට | 6400 | 1540 | 10% |
| | 13600 | 2570 | |

* දේපල පිරියත හා උපකරණ සරල මර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
* 2018-01-01 දින රු 2400 000 ක් වටිනා මෝටර් රථයක් මිල දී ගෙන තිබූ අතර එය නිසි පරිදි ගිණුම්ගත කර ඇත.
* 2018-03-31 දින ඉඩම ප්‍රථම වතාවට රු 4 200 000 කට ප්‍රත්‍යාගණනය කරන ලද අතර එය නිසි පරිදි ගිණුම්ගත කර ඇත.

iii. ප්‍රදර්ශනාගාරයක් කුලියට ලබාගෙන තිබූ අතර කුලී ගිවිසුමට අනුව,

* සෑම වසරකම ජනවාරි 01 දින වාර්ෂික බදු කුලී මුදලින් ගෙවනු ලැබේ.
* සෑම වසරකම ජනවාරි 01 දින බදු කුලී ගිවිසුම අලුත් කරනු ලැබේ.
* 2017 වර්ෂය සඳහා වාර්ෂික බදු කුලී රු 360 000 කි.
* 2018 වර්ෂය සඳහා වාර්ෂික බදු 480 000 කුලී

iv. සේවක අර්ථ සාධක අරමුදල් සේවක දායකය වැටුපෙන් 10% ක් වන අතර සේව්‍ය දායකය 15% කි. වර්ෂය තුළ දී සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප හා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවූ මුදල පමණක් ගිණුම් පොත්වල සටහන් කර ඇත.
සේවක භාරකාර අරමුදල් දායකය 3% කි.

v. වර්ෂයක වගකීම් සහතික මත විකුණුම් සිදු කරනු ලැබේ.

* ප්‍රවර්ථන වර්ෂයේ (2017/2018) වගකීම් සහතික ප්‍රතිපාදනය රු 300 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
* වර්ෂය තුල ගෙවූ අලුත්වැඩියා හා සේවා කිරීම් වියදම් සියල්ල වගකීම් සහතික වෙනුවෙන් දරන ලදී. එම වියදම්වලින් රු 80000 ක් 2016/2017 ගිණුම් වර්ෂය සඳහාය.

vi. ප්‍රවර්ථන වර්ෂයේ අවසාන කාර්තුවේ ආදායම් බදු වගකීම රු 150 000 ක් ලෙස ඇස්තමේන්තුකර ඇත.

ආදායම් බදු ගෙවීම්

2016/2017 වර්ෂය සඳහා රු 220 000
2017/2018 වර්ෂය සඳහා රු 470 000
රු. 690000

vii. 2018-03-31 දිනට උපචිත විදුලි ගාස්තු රු 30 000 ක් වන අතර එදිනට ලැබිය යුතු කොමිස් රු 180 000 කි.

viii. ප්‍රචාරණ කටයුතු සඳහා නොමිලේ බෙදාහරින ලද තොගවල පිරිවැය රු 500 000 ක් වූ අතර මේ පිළිබඳව ගැලපීම් කර නැත.

ix. 2017/2018 වර්ෂය සඳහා රු 240 000 ක ලාභාංශ යෝජනා කර ඇත.

x. 2018/2019 ගිනුම් වර්ෂය තුළ දී ගෙවිය යුතු බැංකු ණය වාරිකය රු 450 000 කි. එම වාරිකය තුළ ඇතුළත් ණය පොලිය රු 200 000 වේ.

අවශ්‍ය වන්නේ

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සනාරි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

1. 2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2. 2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
3. 2018-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 20)

(02) පහත දැක්වෙන තොරතුරු පාසල් බෑග් නිෂ්පාදනයකර අලෙවිකරණ සමාගමකට අදාළ වේ.

i. ඍජු ද්‍රව්‍ය (බෑග් මසන රෙදි)

* වාර්ෂික පාරිභෝජනය - රෙදි මීටර් 24000
* එක් ඇනවුමක පිරිවැය රු. 250
* තොග ඒකකයක් (රෙදි මීටරයක්) වර්ෂයක් තබා ගැනීමේ පිරිවැය රු. 12

ii. බෑග් නිෂ්පාදනය සඳහා භාවිතා කරන රෙදි පරිභෝජනය හා ඇනවුම් කිරීමේ පොරොත්තු කාලය

| | දිනක පාරිභෝජනය රෙදි මීටර් | තොග ඇනවුම් කිරීමේ පොරොත්තු කාලය |
|---|---|---|
| උපරිම | 100 | දින 09 |
| අවම | 60 | දින 05 |

iii. 2019 ජනවාරි මාසය තුළ දී ද්‍රව්‍ය මිලදීගැනීම් හා නිකුත්කිරීම් පිළිබඳ තොරතුරු

* 2019-01-01 දිනට ඉතිරි රෙදි තොගය මීටර් 400 කි. මීටරයක ගැනුම් මිල රු 36 කි.
* ජනවාරි මාසයේ තොග මිලදීගැනීම් හා නිකුත් කිරීම්

| දිනය | සැපයුම්කරු | රෙදි මීටරයක ගැනුම් මිල | මිලට ගැනුම් රෙදි මීටර් | නිකුත් කිරීම් රෙදි මීටර් |
|---|---|---|---|---|
| 01-02 | නාලක සමාගම | 40 | 1000 | - |
| 01-03 | නිකුත් කිරීම් | - | - | 500 |
| 01-10 | නිකුත් කිරීම් | - | - | 800 |
| 01-16 | ප්‍රදීපා සමාගම | 42 | 1000 | |
| 01-22 | නිකුත් කිරීම් | - | - | 900 |
| 01-31 | නාලක සමාගම | 41 | 1000 | - |
| | | | 3000 | 2200 |

* බෑග් එකක් නිපදවීමට රෙදි මීටර් 2 ක් අවශ්‍ය වේ. මාසය තුළ දී බෑග් 1100 ක් නිෂ්පාදනය කර ඇත.

iv. සේවකයින් හා සේවක වැටුප් පිළිබඳ විස්තර

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | මාසික ස්ථිර වැටුප් රු |
|---|---|---|
| රෙදි කැපීමේ සේවකයින් | 02 | 3000 |
| බෑග් මැසීමේ සේවකයින් | 04 | 3500 |
| ගබඩා සේවකයන් | 01 | 3000 |
| කාර්යාලීය සේවක (පරිපාලන) | 01 | 6000 |

වෙනත් තොරතුරු

සේවක දිරි ගැන්වීම දීමනා (ස්ථිර වැටුපට අමතරව)

බෑග් එකක රෙදි කැපීම සඳහා රු 2

බෑග් එකක් මැසීම සඳහා රු 3

v. 2019-01-01 දිනට වෙළෙඳ ණය හිමියෝ

| | | |
|---|---|---|
| නාලක සමාගම | රු | 10 000 |
| ප්‍රදීපා සමාගම | රු | 8 000 |
| | | 18000 |

vi. ජනවාරි මාසය සඳහා මුදල් ගෙවීම් සාරාංශය

| | ලද වට්ටම් රු | මුදල් ගෙවීම රු |
|---|---|---|
| නාලක සමාගම | 650 | 65 000 |
| ප්‍රදීපා සමාගම | 350 | 35 000 |
| බෑග් සඳහා අනෙකුත් සෘජු ද්‍රව්‍ය මිල දී ගැනීම | | 6 200 |
| කර්මාන්ත ශාලා විදුලි ගාස්තු (මාසික) | | 7 000 |
| කර්මාන්ත ශාලා බදු කුලී (මාසික) | | 3 300 |
| සේවක වැටුප් ගෙවීම් (සියලුම සේවකයින් සඳහා) | | 32 000 |
| ප්‍රචාරන වියදම් | | 5 000 |

vii. වෙනත් තොරතුරු

* යන්ත්‍ර සූත්‍රවල වාර්ෂික ක්ෂය වීම් රු 120 000 කි.
* බෑග් එකක් විකිනීම වෙනුවෙන් රු 20 ක කොමිස් මුදලක් ගෙවනු ලැබේ.
* බෑග් එකක් විකිණීමෙන් අපේක්ෂිත ශුද්ධ ලාභය රු 150 කි.

අවශ්‍ය වන්නේ,

1. ආර්ථික ඇනවුම් ප්‍රමාණය **(සූත්‍රය භාවිත කරමින්)**
2. පහත තොග මට්ටම් ගණනය කරන්න.
   i) යලි ඇනවුම් මට්ටම ii) උපරිම තොග මට්ටම iii) අවම තොග මට්ටම
3. ගබඩා ලෙජරය බෑග් රෙදි සඳහා - පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට (FIFO)
4. නිෂ්පාදන පිරිවැය ලේඛනය
5. ණයහිමි පාලන ගිණුම
6. බෑග් එකක අපේක්ෂිත විකුණුම් මිල ගණනය කරන්න. (ලකුණු 20)

(03) සරත් පාවහන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. 2019 වර්ෂයේ **ජනවාරි මාසයේ දී** කරන ලද ගණුදෙණු පහත දැක්වේ.

අ)

| දිනය | චෙක්පත් අංකය | ගණුදෙනුව |
|---|---|---|
| 01-01 | - | සමනළ සමාගමෙන් ණයට මිල දී ගත් පාවහන් තොගය රු 780 000 |
| 01-03 | 2021 | අත්පිට විකුණුම් රු 820 000 එම තොගයේ පිරිවැය රු 460 000 |
| 01-07 | | ජනවාරි 01 දිනට පැවති ණය ගැතියන්ගෙන් ලද මුදල් |
| | 1203 | දසුන්ගෙන් රු 150 000 |
| | 2412 | නුවන්ගෙන් රු 210 000 |
| 01-10 | - | ජනවාරි 01 දින මිල දී ගත් තොගවලින් රු 40 000 ක තොග ආපසු යවන ලදී. |
| 01-15 | - | කිර්තිට ණයට විකුණුම් රු 630 000 එම තොගයේ පිරිවැය රු 400 000කි. |
| 01-18 | 1302 | විදුලි ගාස්තු ගෙවීම් රු 35 000 |
| 01-21 | 1303 | සරත්ගේ පෞද්ගලික මෝටර් රථය සඳහා රු 25 000 ක රක්ෂණ ගාස්තු ගෙවන ලදී. |
| 01-24 | 1304 | රු 10 000 වට්ටම් ලබා ගනිමින් ජනවාරි පළමුවන දින පැවති ණය හිමියන්ට මුදල් ගෙවන ලදී. |
| 01-27 | 6118 | ගොඩනැගිල්ලෙන් කොටසක් ජනවාරි 01 දින රු 30 000 ක මාසික කුලියකට බදු දෙන ලදී. මාස දෙකක කුලී ලැබී ඇත. |
| 01-30 | - | ජනවාරි මස බැංකු ණය වාරිකය වූ රු 250 000 අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී. මෙම ණය වාරිකය තුළ ඇතුළත් පොලිය රු 50 000 කි. |

e-thaksalawa The National e-Learning Portal for The General Education

ආ) ජනවාරි මාසය සඳහා ලැබුණු බැංකු ගිණුම් ප්‍රකාශනය

මහජන බැංකුව

මාතර

ගිණුම් අංකය 013269

(සරත් ව්‍යාපාරික ආයතනය)

| දිනය | විස්තරය | | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|---|
| 01-01 | ශේෂය | | - | - | 440 000 |
| 01-03 | චෙක්පත් අංකය | 2021 | | 820 000 | 1 260 000 |
| 01-09 | චෙක්පත් අංකය | 1203 | | 150 000 | 1 410 000 |
| 01-10 | චෙක්පත් අංකය | 2412 | | 210 000 | 1 620 000 |
| 01-18 | චෙක්පත් අංකය | 1302 | 35 000 | - | 1 585 000 |
| 01-22 | චෙක්පත් අංකය | 1303 | 25 000 | - | 1 560 000 |
| 01-26 | බැංකු ගාස්තු - | | 10 000 | | 1 550 000 |
| 01-31 | ස්ථාවර නියෝග ගෙවීම් | | 60 000 | | 1 490 000 |
| 01-31 | සෘජු ප්‍රේෂණ - කීර්ති | 5122 | | 300 000 | 1 790 000 |

ඇ) වෙනත් තොරතුරු

1. ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවා ඇත්තේ 2019 වර්ෂයේ වාර්ෂික වරිපනම් ගාස්තුවයි.
2. කීර්තීට දුන් වට්ටම රු 15 000 කි.
3. දේපල පිරියත උපකරණවල මාසික ක්ෂය වීම රු 15 000 කි.

The National e-Learning Portal for The General Education

අවශ්‍ය වන්නේ,

1. ජනවාරි 01 දින සිට ජනවාරි 30 දක්වා ඉහත (අ) කොටසෙහි දක්වා ඇති ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට ඇතිවන බලපෑම **පහත ආකෘතිය භාවිත කරන්න.**

| දිනය | වත්කම් (රු 000) | | | | වගකීම් (රු 000) | | හිමිකම් (රු 000) | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත හා උපකරණ | පාවහන් තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | බැංකු ශේෂය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | බැංකු ණය | ප්‍රාග්ධන ගිණුම | රඳවා ගත් ඉපයුම් |
| 01 - 01 ශේෂය | 1600 | 400 | 360 | 440 | 710 | 600 | 1200 | 290 |

2. ශුද්ධ වත්කම් වෙනස්වීමේ පදනම මත ඉහත (අ) කොටසේ ගණුදෙණු මගින් ඇතිවන ශුද්ධ ලාභය හෝ ආලාභය ගණනය කරන්න.
3. බැංකු ශේෂය සංශෝධනය කර බැංකු සැසඳුම් ප්‍රකාශනය
4. ඉහත ආ) සහ ඇ) තොරතුරු ද පදනම් කරගෙන ජනවාරි මාසයේ නිවැරදි ශුද්ධ ලාභය ගණනය කරන්න.

(ලකුණු 20)

(04) අ) අරුණ සඳුන් හා පුබුදු හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම

* අරුණට රු 20 000 ක් ද සඳුන් හා පුබුදුට රු 30 000 බැගින් ද මාසික වේතන හිමි වේ.

* ස්ථාවර ප්‍රාග්ධනය සඳහා 10% බැගින් වාර්ෂික පොළී හිමි වේ.

* ලාභලාභ අරුණ සඳුන් හා පුබුදු අතර පිළිවෙලින් 2 : 2 : 1 අනුපාතයට බෙදා ගත යුතුය.

අරුණ, සඳුන්, පුබුදු හවුල් ව්‍යාපාරය

2018-03-31 දිනට ශේෂ පිරික්සුම

| | | රු 000<br>හර | රු 000<br>බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් : | | | |
| | අරුණ | | 3500 |
| | සඳුන් | | 3300 |
| | පුබුදු | | 2000 |
| ජංගම ගිණුම් : | 2017-04-01 දිනට | | |
| | අරුණ | | 630 |
| | සඳුන් | 200 | |
| | පුබුදු | | 720 |
| ශුද්ධ ලාභය | | | 2290 |
| දේපල පිරියත උපකරණ (ධාරණ අගය) | | 7800 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | | 560 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | | 710 |
| බැංකු ශේෂය | | 4150 | |
| 2018-03-31 තොගය | | 440 | |
| | | 13150 | 13150 |

The National e-learning Portal for The General Education

වාර්ෂික ශුද්ධ ලාභය ගණනය කිරීමේ දී පහත දක්වෙන වැරදි හා මගහැරීම් සිදු වී ඇත.

1. රු 80 000 ක පිරිවැය වූ තොග අරුණගේ පෞද්ගලික පරිත්‍යාගයක් ලෙස පාසලකට ලබා දී ඇත. මේ පිළිබඳව පොත්වල වාර්තා කර නැත.

2. වර්ෂය තුළ දී පිළිවෙලින් සඳුන් හා පුබුදු ලබාගත් රු 30 000 ක හා රු 40 000 ක වේතන ව්‍යාපාරයේ වියදම් ලෙස වාර්තා කරඇත.

3. ව්‍යාපාරයේ පැවති මෝටර් රථය පුබුදුගේ පෞද්ගලික ගමනක් සඳහා යොදා ගෙන ඇත. එහි සේවා ගාස්තුව රු 60 000 කි. මේ පිළිබඳව ගැලපීම් කරනැත.

4. සඳුන් විශ්‍රාම යන දින රු 1600 000 ක ධාරණ අගයක් සහිත මෝටර් රථයක් රු 1 450 000 කට පවරා ගෙන ඇත.

5. 2018-03-31 දිනට පැවති තොගය තුළ රු 18 000 ක යල් පැනගිය තොග ඇතුළත් වේ.

6. අරුණගේ පෞද්ගලික නිවසේ 2018 මාර්තු මස විදුලි බිල රු 8 000 ක් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ගෙවා ව්‍යාපාරික වියදමක් ලෙස වාර්තා කර ඇත.

2018-03-31 දින සඳුන් විශ්‍රාම ගත් අතර එදින

* ව්‍යාපාරයේ කීර්තිනාමය රු 600 000 කට තක්සේරු කරන ලදී. කීර්ති නාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපිය යුතුය.
* සඳුන් විශ්‍රාම ගත් පසු අරුණ හා පුබුදු ලාභ අලාභ සම සමව බෙදා ගනිමින් තවදුරටත් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට එකඟ විය.
* සඳුන්ගේ හිමිකම් කොටස ණය ගිණුමකට මාරු කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

1. ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය
2. ලාභ අලාභ බෙදාහැරීමේ ප්‍රකාශය
3. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

ආ) කාංචන ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක යෙදී සිටින අතර සියලුම මුදල් ගණුදෙනු ජංගම ගිණුමක් මඟින් සිදු කරයි.

2019 ජනවාරි මස සිදු වූ ගණුදෙණු

| දිනය | ගණුදෙණුව | (රු'000) |
|---|---|---|
| 01-01 | අත්පිට විකුණුම් | 920 |
| 01-04 | ගණුදෙනු කරුවකු වූ අමල්ගෙන් ලද මුදල් (දුන් වට්ටම 20) | 630 |
| 01-07 | අත්පිට විකුණුම් | 760 |
| 01-12 | ගණුදෙනුකරුවකු වූ කසුන්ගෙන් ලද මුදල් (දුන් වට්ටම 30) | 820 |
| 01-15 | අත්පිය ගැණුම් | 980 |
| 01-18 | ලද කොමිස් | 40 |
| 01-20 | ණයහිමි සම්පත්ට ගෙවීම් (ලද වට්ටම් 20) | 880 |
| 01-21 | මෝටර් රථ මිල දී ගැනීම් | 200 |
| 01-23 | භාණ්ඩ මිලට ගැනීම සඳහා ප්‍රසන්නගෙන් ලද අන්තිකාරම් | 120 |
| 01-25 | ගණුදෙණුකරුවකු වූ තිලක්ගෙන් ලද චෙක්පත | 90 |
| 01-28 | රු 600 ක ධාරණ අගයක් සහිත කාර්යාලීය උපකරණ විකිණීමෙන් | 70 |
| 01-31 | සේවක වැටුප් ගෙවීම් | 150 |

ණයගැතියන් සම්බන්ධ ගනුදෙණු

| ණයගැතියා | 2019-01-01 ශේෂය | ණයට විකුණුම් | ආපසු එවුම් (රු. 000) |
|---|---|---|---|
| අමල් | 650 | 820 | - |
| තිලක් | 670 | - | - |
| කසුන් | 850 | 600 | 16 |
| ප්‍රසන්න | - | 160 | 5 |
| එකතුව | 2170 | 1580 | 21 |

* ණයට ගැණුම් විස්තර

| සැපයුම්කරු | (රු 000) |
|---|---|
| සම්පත් | 630 |
| තිළිණ | 610 |
| එකතුව | 1240 |

* 2019-01-01 දිනට පැවති ගිණුම් ශේෂ කිහිපයක් පහත දක්වේ.

| | (රු'000) |
|---|---|
| බැංකු ශේෂය | 1890 |
| උපචිත වැටුප් | 20 |

* වෙනත් තොරතුරු

1. තිලක්ගෙන් ලද චෙක්පත අගරු විය.
2. ජනවාරි මස වැටුප් ලේඛනයට අනුව වැටුප රු 160 000 කි.

අවශ්‍ය වන්නේ,

1. මුදල් ලැබීම් ජ'නලය හා ගෙවීම් ජ'නලය
2. මුදල් පාලන ගිණුම
3. ණයගැති පාලන ගිණුම
4. විකුණුම් ගිණුම
5. වැටුප් ගිණුම

(05) අ) සීමිත අමරසිරි පොදු සමාගම 2017-04-01 දින ප්‍රථමවරට මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර එහි මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

සීමිත අමරසිරි පොදු සමාගම
2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | (රු'000) |
|---|---|
| විකුණුම් | 13 200 |
| විකුණුම් පිරිවැය | (7 900) |
| දළ ලාභය | 5 300 |
| වෙනත් ආදායම් (ස්ථාවර තන්පත් පොළී) | 150 |
| මෙහෙයුම් වියදම් | (3 630) |
| බදු පෙර ලාභය | 1 820 |
| ආදායම් බදු | (410) |
| වර්ෂයේ ලාභය | 1 410 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 350 |
| මුළු විස්තීර්ණ ආදායම | 1760 |

සීමිත අමරසිරි පොදු සමාගම
2018-03-31 දිනට
සංක්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | (රු.'000) |
|---|---|
| ඉඩම් | 3 700 |
| මෝටර් රථය - ධාරණ අගය | 2 800 |
| තොගය (ශුද්ධ උපලබ්ධි අගය) | 660 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 780 |
| බැංකු ශේෂය | 490 |
| | 8430 |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 4 460 |
| ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය | 350 |
| රඳවාගත් ඉපැයුම් | 1 080 |
| බැංකු ණය | 1 600 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 840 |
| උපචිත විදුලිය | 40 |
| උපචිත ආදායම් බදු | 60 |
| | 8430 |

අතිරේක තොරතුරු

1. සියලු ගැනුම් හා විකුණුම් ණය පදනමට සිදුකර ඇත.
2. මෙහෙයුම් වියදම් තුළ පහත දක්වෙන වියදම් ඇතුළත් වේ.

| | | | |
|---|---|---|---|
| මෝටර් රථ ක්ෂය - | රු. 600 000 | තොග කපා හැරීම් - රු | 30 000 |
| බැංකු ණය පොලී - | රු 180 000 | අනෙකුත් වියදම් - රු | 2 820 000 |

3. වර්ෂය තුළ ගෙවන ලද බැංකු ණය වාරිකය රු 380 000 කි. එහි ඇතුළත් පොලිය රු 180 000 කි.
4. ගෙවූ ලාභාංශ රු 330 000 කි.
5. 2017-10-01 දින රු 1 500 000 ක් මාස 6 ක ස්ථාවර තැන්පතුවක යොදන ලදී. එය 2018-03-31 දින කල්පිරී. නියමිත පොලිය සහ තැන්පත් මුදල ලැබුණි.

අවශ්‍ය වන්නේ,

LKAS - 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශ ප්‍රමිතය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ආ) සීමිත අරලිය පොදු සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශන පහත දැක්වේ. (සියලු සංඛ්‍යා රු 000 වලිනි)

| | 2017-03-31 | 2018-03-31 |
|---|---|---|
| **වත්කම්** | | |
| දේපල පිරියත උපකරණ - ධාරණ අගය | 4500 | 4000 |
| තොගය | 460 | 500 |
| වෙළඳ ණය ගැතියෝ | 480 | 720 |
| බැංකු ශේෂය | 1060 | 1780 |
| | 6500 | 7000 |
| **හිමිකම් හා වගකීම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 2000 | 2000 |
| රඳවාගත් ඉපයුම් | 700 | 1600 |
| බැංකු ණය | 3000 | 2400 |
| වෙළඳ ණය හිමියෝ | 800 | 1000 |
| | 6500 | 7000 |

2018-03-31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙන් උපුටා ගත් තොරතුරු (රු 000 වලිනි.)

| | | | |
|---|---|---|---|
| * විකුණුම් | 12 000 | * දළ ලාභය | 4 800 |
| * වර්ෂයේ ලාභය | 1 200 | * පොලී වියදම් | 200 |
| * ආදායම් බදු වියදම | 400 | * වෙනත් මෙහෙයුම් වියදම් | 3 000 |

වෙනත් තොරතුරු (රු 000 වලිනි.)

* ගෙවූ ලාභාංශ රු 300
* 2018-03-31 දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ගණන 200
* සමාගම ගිණුම් වර්ෂය තුළ දින 360 ක් ව්‍යාපාර කටයුතු පවත්වා ඇත.

අවශ්‍ය වන්නේ,

පහත දක්වෙන අනුපාත ගණනය කිරීම (2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

1. ශුද්ධ ලාභ අනුපාතය
2. මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
3. තොග පිරිවැටුම් අනුපාතය
4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
5. පොලී ආවරණ අනුපාතය
6. ණය හිමිකම් අනුපාතය
7. කොටසක ඉපයුම්

The National e-learning Portal for The General Education

ඇ) සීමිත මොහාන් පොදු සමාගම 2019-01-01 දින එකක් රු 40 බැගින් වූ සාමාන්‍ය කොටස් 20 000 ක් නිකුත් කරන ලදී.

2019-01-31 දින කොටස් 25 000 ක් සඳහා මුදල් ලැබුණි.

2019-02-05 දින කොටස් විභජනය කර අතිරික්ත අයදුම් මුදල් ආපසු යවන ලදී.

අවශ්‍ය වන්නේ,

කොටස් නිකුත් කිරීමට අදාල ජර්නල් සටහන්

(06) අ) රජයේ පාසලක ආදි ශිෂ්‍ය සංගමයට අදාල තොරතුරු පහත දක්වේ.

* 2018-01-01 දිනට පැවති වත්කම්

| | |
|---|---|
| බැංකු ශේෂය | රු 500 000 |
| කාර්යාල උපකරණ | රු 180 000 |

* සාමාජික සංඛ්‍යාව හා සාමාජික මුදල් පිළිබඳ තොරතුරු
    - වාර්ෂික සාමාජික මුදල රු 600
    - 2018-01-01 දිනට සාමාජික සංඛ්‍යාව 2000 කි.
    - 2017 ගිණුම් වර්ෂයේ දී සාමාජිකයින් 50 දෙනෙකු 2018 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා ඇත.
    - 2018-12-31 දිනට පැරණි සාමාජිකයන් 80 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නැත. ඉතිරි පැරණි සාමාජිකයන් නිසි පරිදි සාමාජික මුදල් ගෙවා ඇත.
    - 2018-09-01 දින නව සාමාජිකයන් 400 දෙනෙකු බඳවා ගත් අතර ඔවුන් වර්ෂයක් සඳහා සාමාජික මුදල් ගෙවා ඇත.
    - සාමාජිකයෙකුගේ ඇතුළත් වීමේ ගාස්තුව රු 3000 කි. ඇතුළත් වීමේ ගාස්තු වර්ෂ තුනක දී ආදායම් ලෙස හඳුනා ගනී.
* වාර්ෂික සංවත්සරය 2018-12-10 දින පවත්වන ලදී. එම සංවත්සරය සඳහා කරන ලද ගණුදෙනු
    - සමරු කලාපයක් මුද්‍රණය කළ අතර ඒ සඳහා ලැබුණු අනුග්‍රාහක වෙළඳ දැන්වීම් පිළිබඳ විස්තර

| | දැන්වීම් ගාස්තු | ලැබුණු දැන්වීම් ගණන |
|---|---|---|
| වර්ණ පිටුවක් | රු 2500 | 60 |
| කළු සුදු පිටුවක් | රු 1000 | 40 |

* 2018-12-31 දිනට වෙළඳ දැන්වීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු 32 000 කි.

අනෙකුත් ගණුදෙනු :

| | |
|---|---|
| * සමරු කලාප මුද්‍රණ වියදම් ගෙවීම් | රු 250 000 |
| * සංග්‍රහ වියදම් ගෙවීම් | රු 90 000 |
| * ලද පරිඝනක යන්ත්‍ර පරිත්‍යාග | රු 150 000 |
| * පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ගෙවූ විදයම් | රු 280 000 |
| * විදුලිය ගාස්තු ගෙවීම් | රු 80 000 |

- පරිගණක පාඨමාලාව

ප්‍රදේශයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන්ට මාස 6 ක පරිගණක පාඨමාලාවක් 2018-10-01 දින ආරම්භ කළ අතර එම පාඨමාලාව සම්බන්ධ තොරතුරු

* පාඨමාලා සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 180 කි.

* මාසික ඇගයීමක් සිදු කරන අතර සෑම ශිෂ්‍යයකුගෙන්ම එක් ඇගයීමක් සඳහා රු 100ක ගාස්තුවක් සෑම මසකම 15 වන දින අය කර ගනී. අදාල ගාස්තු නිසි පරිදි ලැබී ඇත.

* දේශකවරුන්ගේ මාසික වැටුප රු 50 000 වන අතර සෑම මසකම වැටුප් ඊළඟ මාසයේ 05 වන දින ගෙවනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1. සාමාජික මුදල් ගිණුම
2. 2018 වර්ෂය සඳහා මුදල් ගිණුම
3. 2018-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
4. 2018-12-31 දිනට සමුච්චිත අරමුදල

ආ) 2018-12-31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන සමන්තාගේ ව්‍යාපාරයේ ගිණුම් තැබීමේ දී පහත දක්වෙන වැරදි හා දෝෂ සිදු වී තිබුණි.

1. දෙසැම්බර් මාසය සඳහා ගෙවූ ගොඩනැගිලි කුලී රු 1800 මුදල් ගෙවීම් ජ'නලයෙන් ගෙවල් කුලී ගිණුමට රු 180 ක් ලෙස පිටපත් කර ඇත.
2. මුදල් ගෙවීම් ජ'නලයේ ණයහිමි විශ්ලේෂණ තීරුවේ එකතුව රු 100 ක් අඩුවෙන් ගණනය කර ඇත.
3. අත්පිට මුදලට ගත් රු 2000 ක කාර්යාල උපකරණ මුදල් ගෙවීම් ජ'නලයේ අත්පිට ගැණුම් තීරුවට පිටපත් කර ඇත.
4. මුදල් ලැබීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව රු 560 මුදල් පාලන ගිණුම බැර කර දුන් වට්ටම් ගිණුමට පිටපත් කර ඇත.
5. ගණුදෙණු කරුවකුගෙන් ලද රු 800 ක චෙක්පත බැංකුව විසින් අගරුකර ඇති අතර එය මුදල් ලැබීම් ජ'නලයේ වාර්තා කර ණය ගැති විශ්ලේෂණ තීරුවට පිටපත් කර ඇත.
6. ස්ථාවර නියෝග මත ගෙවූ ආදායම් බදු රු 800 ක් වූ අතර එය ආදායම් බදු වියදම් ගිණුම හර කිරීම හැර වෙනත් සටහන් තබා නැත.

අවශ්‍ය වන්නේ,

වැරදි නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන්

ඇ) සීමිත සහිරා පොදු සමාගමේ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධ තොරතුරු (රු'000)

| වත්කම් | මිලට ගත් දිනය | පිරිවැය | ඵලදායී ජීව කාලය | සුන්බුන් අගය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 2015-04-01 | 3600 | 20 | 600 |
| මෝටර් රථ | 2015-04-01 | 3000 | 10 | 600 |
| කාර්යාල උපකරණ | 2016-04-01 | 1500 | 05 | 300 |

2018-03-31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සිදු වූ ගණුදෙණු පහත දක්වේ.

1. 2017-04-01 දින ගොඩනැගිලි 4 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. තව ද එදින ගොඩනැගිලිවල ඉතිරිඵලදායී ජීවකාලය වර්ෂ 20 ලෙස තක්සේරු කරන ලදී. සුන්බුන් අගය වෙනස් නොවේ.

2. 2017-04-01 දින පැරණි මෝටර් රථය රු 2 500 000 කට විකුණන ලදී.

අවශ්‍ය වන්නේ,

1. 2018-03-31 දිනෙන් අවසන් වර්ෂයේ දේපල පිරියත උපකරණ වාර්ෂික ක්ෂය (වෙන් වෙන්ව)
2. ගොඩනැගිලි ගිණුම
3. මෝටර් රථ විකුණුම් ගිණුම / ඉවත් කිරීමේ ගිණුම

(ලකුණු 20)